පානදුර ප්‍රදේශයේ අයෙකු දිවි අහිමි කරගැනීම සහ පසුව ඔහු කොවිඩ්-19 ආසාදිතයෙකු බව අනාවරණය වීම, රූපවාහිනී පුවත් විකාශයන් ඇතුළු මාධ්‍ය තුළ පළවී තිබිණි. විශේෂයෙන්ම මෙය කොවිඩ්-19 මරණයක් නොවීම යන පදනම යටතේ දිවි අහිමි කරගැනීමක් බව වාර්තා කිරීම කළ යුතු වුවත්, එහිදී නිසි ආකාරයෙන් දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම හා සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීමද අත්‍යාවශ්‍ය වේ.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම් මෙම පුවත් වාර්තාවන් තුළ මෙම පුද්ගලයා දිවි අහිමි කරගත් ආකාරය සඳහන් කෙරෙන අතර, උපකාරක අංක සඳහන් කිරීමක් දක්නට නොලැබේ. දිවි අහිමි කරගැනීම් සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශනයන් තුළ දිවි අහිමි කරගත් ආකාරය සඳහන් නොකරන ලෙසින් උපදෙස් දෙනු ලබන්නේ, ඒ ඔස්සේ තවත් දිවි අහිමි කරගැනීම් සිදුවීමට වක්‍රාකාරයෙන් පෙළඹවීමක් ඇති කළ හැකි බැවිනි. එසේම දිවි අහිමි කරගැනීමේ පුවත් සමගින් උපකාරක අංක සඳහන් කරන මෙන් මාධ්‍යවේදීන්ව දිරිමත් කරනු ලබන්නේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීම සඳහා නැඹුරුතාවයක් ඇති අයෙකුගේ දිවි ගලවා ගැනීමට ඉඩක් තිබීම නිසායි.

මූලාශ්‍ර:
https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting?fbclid=IwAR3fde9cEIsXqNz6QktfN9uUXW2CHRwMfxH_3vqMYN4nKyWVNhFh2DAJw74

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1&fbclid=IwAR37odzU0qEGt3N3_u-rtf363TWKWKstreSzgmblDtYu1jsrJRuy3vBDGrc

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #TVNews #HiruTV #TVDerana #ITN #Swarnavahini